රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2026.08.25

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමනාකරු
වෙබ් අඩවි කර්තෘ

**ශක වර්ෂ 1949 හෙවත් ව්‍යවහාර වර්ෂ 2027**
**සිංහල අලුත් අවුරුදු නැකැත් සීට්ටුව**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ කේ.එස්.දිල්හානි මහත්මිය විසින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත එවන ලද **ශක වර්ෂ 1949 හෙවත් ව්‍යවහාර වර්ෂ 2027 සිංහල අලුත් අවුරුදු නැකැත් සීට්ටුව** සුදුසු පරිදි ප්‍රචාරය කිරීමට මේ සමඟ එවමු.

ප්‍රචාරක අංශය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තො T - (+94 11) 2515759
ෆැ පෙ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ශ්‍රී
බුද්ධ වර්ෂ
2570

ශක වර්ෂ
1949
ක්‍රි.ව
2027

# 2027 සිංහල අලුත් අවුරුදු නැකත් චාරිත්‍ර

## නව සඳ බැලීම
අභිනව චන්ද්‍ර වර්ෂය සඳහා අප්‍රේල් මස 09 වන සිකුරාදා දින ද අභිනව සූර්ය වර්ෂය සඳහා මැයි මස 07 වන සිකුරාදා දින ද නව සඳ බැලීම මැනවි.

## පරණ අවුරුද්ද සඳහා ස්නානය
අප්‍රේල් මස 12 වන සඳුදා දින දිවුල්පත් යුෂ මිශ්‍ර නානු ගා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණයෙහි යෙදී වාසය මැනවි.

## අලුත් අවුරුදු උදාව
අප්‍රේල් මස 14 වන බදාදා දින අපරභාග 03.29 ට සිංහල අලුත් අවුරුද්ද උදාවෙයි.

## පුණ්‍ය කාලය
අප්‍රේල් මස 14 වන බදාදා පූර්වභාග 9.05 සිට එදින අපරභාග 9.53 දක්වා පුණ්‍ය කාලය බැවින් අප්‍රේල් මස 14 වන බදාදා පූර්වභාග 9.05 ට පළමුව ආහාර පාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත්වල යෙදීම ද පුණ්‍ය කාලයේ අපර කොටස; එනම් අප්‍රේල් මස 14 වන බදාදා අපරභාග. 3.29 සිට එම දා අපරභාග 9.53 දක්වා පහත දැක්වෙන අයුරින් අහාර පිසීම, වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදි නැකත් චාරිත්‍ර විධි ඉටු කිරීම මැනවි.

## ආහාර පිසීම
අප්‍රේල් මස 14 වන බදාදා අපරභාග 6.18 ට කොළ පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා ලිප් බැඳ ගිනි මොළවා මුං මිශ්‍ර කිරිබතක් ද කැවිලි වර්ගයක් ද පිළියෙල කරගැනීම මැනවි.

## වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය
අප්‍රේල් මස 14 වන බදාදා අපරභාග 8.18 ට කොළ පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා සියලු වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර අනුභව කිරීම මැනවි.

## හිසතෙල් ගෑම
අප්‍රේල් මස 17 වන සෙනසුරාදා පූර්වභාග 07.04 ට නිල් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා හිසට නුගපත් ද පයට කරඳපත් ද තබා නුගපත් යුෂ මිශ්‍ර නානු හා තෙල් ගා ස්නානය කිරීම මැනවි.

## රැකිරක්ෂා සඳහා පිටත්ව යෑම
අප්‍රේල් මස 21 වන බදාදා පූර්වභාග 6.15 ට කොල පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී මුංඇට මිශ්‍ර කිරිබතක් අනුභව කර දකුණු දිශාව බලා පිටත්ව යෑම මැනවි.

## පැළ සිටුවීම
අප්‍රේල් මස 22 වන බ්‍රහස්පතින්දා පූර්වභාග 11.38 ට කහ/රන්වන් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී උතුරු දිශාව බලා පැළ සිටුවීම මැනවි.

සැ.යු ඉහත නැකත් වේලාවන් දැනට සම්මත ඔරලෝසු වේලාවෙන් සකස්කර ඇත්තේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඇතිව සිංහල අලුත් අවුරුදු ජාතික නැකත් කමිටුව විසිනි. මෙම වේලාවන් ශ්‍රී ලංකාවේ සියලු ප්‍රදේශවලට නොවෙනස් ව භාවිත කළ හැකිය.

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**
**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**